www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මූල්‍ය අර්බුදය යුරෝපයේ ව්‍යාප්තවීමෙන් බියට පත් ගෝලීය වෙලඳපොල භ්‍රමනය වෙයි.

## Global markets gyrate on fears of Europe’s spreading financial crisis

**ඩේවිඩ් වොල්ෂ් විසිනි**

**2010 මැයි 26**

යුරෝපයේ මූල්‍ය අර්බුදය ව්‍යාප්ත වීම සහ කොරියානු අර්ධද්වීපයේ මිලිටරි ගැටුමක් ඇතිවීමේ හැකියාව ගැන බියට පත් ආයෝජකයින් ගේ සැලීම නිසා, අඟහරුවාදා ගෝලීය වෙලඳපොල සුවිශේෂීව අස්ථිර විය.

පසුගිය සති අන්තයේදී, ස්පාඤ්ඤ ඉතිරිකිරීමේ බැංකුවක් ස්පාඤ්ඤ බැංකුව විසින් පවරාගැනීමට අනුව, යුරෝපීය බැංකු ක්‍රමයේ ස්වභාවය ගැන සාංකාව වර්ධනය වෙමින් තිබේ. ලන්ඩන්හි මූල්‍යමය කටයුතු පිලිබඳ කලමනාකරුවෙක් වෝල් ස්ට්‍රීට් ජර්නලයට පැවසුවේ, “ආලෝක ධාරාව ග්‍රීසියෙන් ... ස්පාඤ්ඤය, පෘතුගාලය සහ බැංකු වෙත හැරී ඇත” යනුවෙනි. අගමැති ජෝසෙ ලුයිස් රොඩ්රිගස් සපතේරෝගේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩුව “අක්‍රියාකාරී ශ්‍රම වෙලඳපොල” ක්‍රියාකාරී කල යුතුයැයි ඉල්ලමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ස්පාඤ්ඤය සම්බන්ධව දැඩි වාර්තාවක් නිකුත් කලේය.

ඔක්තෝබර් 2 පටන් පලමුවරට 5,000 කට පහල අගයකට දිනය නිමා කරමින්, ලන්ඩන්හි එෆ්ටීඑස්ඊ 100 දර්ශකය සියයට 2.5 කින් පහල වැටිනි. “අපි 5,000 කට පහල අගයකට නිකම්ම වැටුනා නෙමෙයි, අපිව ඒ හරහා ඇද වැටුනා.” විශ්ලේෂකයෙක් *ෆයිනෑන්ෂල් ටයිම්ස්* වෙත පැවසීය. පාර්ශ්විකව ජනසතු කර ඇති ලොයිඩ්ස් බැංකුවේ කොටස් සියයට 9 කින් වැටුන අතර, ස්කොට්ලන්ත රෝයල් බැංකුව සහ බාක්ලේස් හි කොටස සියයට 6 කින් පහල ගියේය.

10,000 කට වඩා යන්තම් පොයින්ට් 22 කින් දිනය අවසන් කරන්නට ප්‍රථම වෝල් ස්ට්‍රීට් ඩව් ජෝන්ස් කාර්මික සාමාන්‍යය, අඟහරුවාදා උදේ සියයට 2 කින් හෝ පොයින්ට් 200 කින් පහත වැටිනි. මේ වසරේ පෙබරවාරි 8 සිට ඩව් ජෝන්ස් සාමාන්‍යය එවන් අගයකට දිනය අවසන් කලේ නැත.

ප්‍රන්සයේ ප්‍රධාන කොටස් මිල දර්ශකය වන සීඒසී සියයට 2.9 කින් පහල ගිය අතර, ෆ්‍රැන්ක්ෆර්ට්හි ඩැක්ස් සියයට 2.34 කින් පසු බැස්සේය. මැඩ්රිඩ්හි කෙටස් වෙලඳපොල සියයට 3.05 කිනුත් මිලාන් හි සියයට 3.4 කිනුත් පහල ගියේය.

ආසියාවේ වෙලඳපොලවල් මාස හයක් තුල අවමය සටහන් කරමින් කිඳා බැස්සේය. හොංකොංහි හැන් සෙන් දර්ශකය සියයට 3.5 කින් ඇද වැටෙන අතරේ, ජපානයේ නික්කෙයි 225 දර්ශකය සියයට 3.1 කින් පහල ගියේය. ෂැංහයි ඒකාබද්ධ දර්ශකය සියයට 2 කට ආසන්නව පසු බැසීමකට ලක්විය.

මාස 8 කට ආසන්න කාල සීමාවකදී, ඉන්දියානු රුපියල ඩොලරයට සාපේක්ෂව තම අවම අගයට පහල ගිය අතර මාස තුනක් තුල පලමු වතාවට 30-ෂෙයාර් සෙන්සෙක්ස් දර්ශකය 16,000 කට වඩා අඩු අගයකට පහල වැටුනි.

පසුගිය අගෝස්තුවේ සිට තම අවම අගය සනිටුහන් කරමින් S&P/ASX 200 [ඕස්ට්‍රේලියානු කොටස් වෙලඳපොල දර්ශකයේ වෙලඳපොල ප්‍රග්ධනකරනයේ සහ එහි ඉහල පහල යාම් සැකසීමේ දර්ශකයක්] දර්ශකය සියයට 3 කින් පහල යැමත් සමග, ඕස්ට්‍රේලියාවේ කොටස් වෙලඳපොලද ඇද වැටුනේය. *සිඩ්නි මෝනිං හෙරල්ඩ්* ප්‍රකාශ කලේ, “ගෝලීය ප්‍රකෘතිභාවය යුරෝපීය නය අර්බුදය විසින් පීලි පන්නවනු ඇතැයි ආයෝජකයින් නොරිස්සුම් වන බැවින්, මේ මාසයේ ඩොලර් බිලියන 150 කට ආසන්න අගයකට ඕස්ට්‍රේලියානු කොටස් වෙලඳපොල පහල ගියේය”යනුවෙනි.

එක් කාර්ය නියුතු කලමනාකරුවෙකුට අනුව, මැයි 10 දා ප්‍රකාශයට පත්කල යුරෝ බිලියන 750 ක (එජ ඩොලර් බිලියන 955) ඇපදීමෙන් වෙලඳපොලේ ජනිත වූ ප්‍රීතිය දිගු කාලයකට පෙර පහව ගොස් එය “හිත හිරිවට්ටවන” චංචලත්වයකට හිලව් කර ඇත.

ග්‍රීක-ආකාරයේ අර්බුදයකට ඊලඟට මුහුනපාන්නේ ස්පාඤ්ඤය බවද, එහි සමාජවාදී පක්ෂ ආන්ඩුවට, කම්කරු පන්ති ප්‍රතිරෝධය හමුවේ වෙලඳපොල විසින් ඉල්ලා සිටින දරුනු කප්පාදු පිලිවෙත් පනවන්නට අවශ්‍ය තරමේ “දේශපාලන අධිෂ්ඨානයක්” නොමැති බවටද සාංකාව, මූල්‍ය කවයන්

තුල බහුලව පවතී. ව්‍යාපාර පුවත්වල සටහනෙන් සටහනට යුරෝපීය කලාපය පුරා අර්බුදය ව්‍යාප්ත වන ආකාරය පෙන්වා දෙන අතර, ස්පාඤ්ඤයේ ප්‍රධාන බැංකු ඇපදීම් සහ නය කපාහැරීම් සඳහා සුවිශේෂීව හැකියාව ඇති බවද පෙන්වා දෙයි.

පසුගිය සති අන්තයේදී, දකුනු ස්පාඤ්ඤයේ කොර්ඩොබාහි කතෝලික පල්ලිය විසින් පවත්වා ගෙන ගිය ඉතිරිකිරීමේ බැංකුව වන කජාසුර්හි මෙහෙයුම් ස්පාඤ්ඤ බැංකුව විසින් අත්පත්කරගන්නා ලදී. 2009 දී, යුරෝ මිලියන 596 ක් අලාභ වුන බැංකුව ඉදිකිරීම් සහ දේපල වටිනාකම් බිඳ වැටීමෙන් විනාශ විය. වාර්තාවනට අනුව, එය සතුව යුරෝ බිලියන 2.2 ක හිගව පවත්නා නොගෙවූ නය තිබී ඇත.

බැංකුව සාපේක්ෂව කුඩා වුවත්, ස්පාඤ්ඤ බැංකු පද්ධතියේ පුළුල් ගැටලු සම්බන්ධව රෝග ලක්ෂන එමගින් පෙන්නුම් කරන බවට ආයෝජකයෝ බිය පල කරති. ආපදා අරමුදලින් උදව් ගැනීම ඉල්ලුම්කරන්නට "කජාස්" හට ජූනි අග දක්වා කල් දුන් මැඩ්රිඩ් ආන්ඩුවේ පීඩනය යටතේ, වෙනත් ඉතිරිකිරීමේ බැංකු 4 ක්, ඒකාබද්ධ වුන බව වාර්තා විය.

ක්‍රෙඩිට් සුයිස් ගෲප් ඒජී හි විශ්ලේෂකයෙක් වන සන්තියාගෝ ලෝපස් මැයි 24 දා සටහනකින්, කජාසූර් පවරාගැනීම ගැන මෙසේ අදහස් පල කලේය. "එය මූල්‍ය ක්‍රමය ගැනත්, ස්වෛරී අවදානම් චිත්‍රනය ගැනත්, හා මූලිකව ම ආර්ථිකය ගැනත්, සැලකිල්ල ඉහල නංවයි."

ප්‍රන්ස බැංකුවක් වන බීඑස්පී පරිබාස් හි ප්‍රධාන මුදල් විශ්ලේෂක හාන්ස් රෙඩෙකර්ගේ ප්‍රකාශයක් උපුටා දක්වන වෝල් ස්ට්‍රීට් ජර්නලය, "මේ තව දුරටත් ග්‍රීසිය ගැන නොවේ... මේ යුරෝපීය මූල්‍ය සංගමය සහ එය පවත්වාගෙන යන්නේ කෙසේද යන්න ගැනයි."

බ්‍රවුන් බ්‍රදර්ස් හරිමන් සහ සමාගමේ ගෝලීය මූල්‍ය උපායමාර්ග ප්‍රධානී මාක් චැන්ඩ්ලර් ඒ ගැනම කල සඳහනක් නිව්යෝක් ටයිම්ස් උපුටා දැක්වීය. "ඒ ගැන සැකයක් පැවතියා නම් එය තව දුරටත් නොපවතී... යුරෝපීය නය අර්බුදය නිකම්ම ග්‍රීක ප්‍රපංචයක් නොවේ." "යුරෝපීය බැංකු, විශේෂිතව ම ස්පාඤ්ඤයේ තිබෙන යුරෝපීය බැංකු, පතුලක් නැති විවරය දෙස බලා සිටිනවා වියහැකි" බවට අයිජී මාකට්ස්හි බෙන් පොටර් අවධානය යොමු කලේය.

අඟහරුවාදා 11 වන වතාවටත් මාස 10 ක් තුල ඉහලම අගයකට, මාස තුනේ ලන්ඩන් අන්තර්බැංකු පිරිනැමූ අනුපාතය (Libor) හෙවත් අන්තර් බැංකු නයදීමේ අනුපාතය ඉහල යාම සුවිශේෂී සැලකිල්ලට භාජනය විය. ස්පාඤ්ඤ බැංකු කඩාවැටීම මගින් බිය සංකා ගැඹුරුකර ඇති ආකාරයෙන් එකිනෙකාගේ නය ගෙවීමේ හැකියාව පිලිබඳ විශ්වාසවන්තභාවය සැකකරන්නට මූල්‍ය ආයතන යලි පටන් ගනීවියැයි පෙනෙන්නට අත.

ග්ලෝබ් සහ මේල් හි ඇන්ඩෲ විලිස් ප්‍රකාශකරන්නේ, "කජාසූර් කඩාවැටීමෙන් අනතුරුව අන්තර් බැංකු නය සම්බන්ධ වියදම් ඉහලයමින් තිබේ. මෙම ස්වභාවය මූල්‍ය ආයතන එකිනෙකා මත විශ්වාසය මුලුමනින් අත්හල සහ නය ලබාගැනීමේ වියදම් ඉහල ගිය 2007 නය මිරිකා හැරීම වැනි තත්වයකට බෙහෙවින්ම සමානය" යනුවෙනි.

ඊනියා 'ආර්ථික ප්‍රකෘතිමත් වීමේ ක්‍රියාවලිය' ඇනහිටීමේ අනතුරක් ඇති බව බොහෝ විචාරකයෝ පෙන්වා දෙති. ආර්ථික විශේෂඥ නූරියල් රූබිනිගේ සහායකයෙක් වන අර්නාබ් දාස් යෝජනා කලේ, "යුරෝපයේදී දෙවරක් පහත වැටීමේ අවස්ථාවක් ඇති අතර එක්සත් ජනපදයේ අවදානම නම් වර්ධනය ඇන හිටීමයි" යනුවෙනි.

"ග්‍රීසිය ගිලී ඇති හිම පර්වතයේ මුදුන පමනයි" දාස් සඳහා සීඑන්බීසී වෙත පැවසීය. "දැන් වසංගතයේ ප්‍රධාන අවදානම ස්පාඤ්ඤය වැනි රටවල් කරා ඇදෙන අතර, එක්සත් රාජධානිය බරපතල ලෙස නයබරිත වී ඇත. කප්පාදු වැඩපිලිවෙලින් වර්ධනය අඩු කරන්නට බලකෙරෙනු ඇති අතර එය කෝපරේට් ලාබ ඉපැයීමට බලපානු ඇත."

අර්බුදය අබිමුවෙහි ආන්ඩුවල සහ මූල්‍ය ආයතනවල සමස්ත ප්‍රතික්‍රියාව නම් රැකියා, ජීවත්වීමේ තත්වයන්, සහ සමාජ සුභ සාධන වැඩසටහන් විනාශය හරහා වැඩකරන ජනතාව මත බර පැටවිය යුතු බවයි.

ජාත්‍යාන්තර මූල්‍ය අරමුදල තම මැයි 24 වාර්තාවේ ඉස්මතු කරන අන්දමට, "ස්පාඤ්ඤ ආර්ථිකයට දුර දිග යන සහ පුලුල් ප්‍රතිසංස්කරන" අවශ්‍යව පවතී. "වැඩිවන තරගකාරිත්වය සහ රැකියාවල" නාමයෙන්, සුභසාධන රාජ්‍යය කඩාදැමීමත්, "අනම්‍ය" කම්කරු ප්‍රතිපත්තිවල අවසානයත්, ජාමූඅ ඉල්ලා සිටී.

"ශ්‍රම වෙලඳපොලෙහි රැඩිකල් පූර්න ප්‍රතිසංස්කරන ඉතා ඉක්මනින් විය යුතු" බවට එක්සත් ජනපද-බලාධිකාරයකින් යුත් එම සංවිධානය බලකර සිටී. ජාමූඅ, "වැටුප් සහ ආයතන වල නම්‍යශීලිත්වයට බාධා ඇති කරවන වැටුප් කේවල් කිරීමේ (වර්තමාන) ක්‍රමයේ වෙනස්කම්" "අඩුම තරමින් යුරෝපීය සංගමයේ මට්ටමට වන්දි ගෙවීම් අවම කිරීම" "වැටුප් නම්‍යශීලිත්වය සහ රැකියා සැපයීම ඉහල නැංවීම", ආදිය සඳහා, තර්ක කරයි.

"රාජ්‍ය අංශයේ වැටුප් කප්පාදු කිරීම් වැනි ස්ථිර සහ දැඩි වැඩපිලිවෙල" ඇතුලත් සපතේරෝ ආන්ඩුවේ මෑතකාලීන මූල්‍ය පැකේජය වාර්තාවෙන් පැසසුමට ලක්කරයි. එය "විශ්‍රාම ගැන්වීමේ වයස 67

දක්වා ඉහල නැංවීම්" වැනි " දැඩි විශ්‍රාම ප්‍රතිසංස්කරන" ඉල්ලා සිටී.

එක්සත් ජනපදයේදී ප්‍රධාන පුද්ගලයෝ ඒ හා සමාන අනතුරු ඇඟවීම් සහ තර්ජන නිකුත් කරමින් සිටිති. බැරැක් ඔබාමාගේ විශේෂ උපදේශක හිටපු ෆෙඩරල් රිසර්ව්හි සභාපති පෝල් වෝල්කර් මැයි 18 වනදා රැස්වීමකදී ඇමරිකාවේ මූල්‍ය විපත් නිරාකරනය කරන්නට ඇති කාලය "අඩුවෙමින්" පවතින බව කීවේය.

වසර පහකට පෙර "මා ඉස්මතු කල දේවල් මැඩ පැවැත්වීමට කටයුතු සිදුවූයේ අඩුවෙන්" බවත්, එක්සත් ජනපදය තුල "අන්තරාදායී සහ දුෂ්කර" ප්‍රශ්න පැනනගිමින් පවතින බවත්, ජනාධිපතිගේ ආර්ථික ප්‍රකෘතිකරන උපදේශක මංඩලයේ සභාපති වෝල්කර් පැවසීය.

කැලිෆෝනියාවේ ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂන සඳහා වන ස්ටැන්ෆර්ඩ් ආයතනයේ රාත්‍රී භෝජන සංග්‍රහයකදී, තමා "අන්තරාදායී සහ දුෂ්කර" ප්‍රශ්න යනුවෙන් අදහස් කලේ කුමක්දැයි ඔහු පැහැදිලි කලේය. "වැඩෙන හිමිකම් වැඩසටහන් වලට අපගේ වගකීමේ තිරසාරත්වය සම්බන්ධව වැදගත් ප්‍රශ්න ක්ෂනිකව මතුවේ."

යුරෝපීය ආන්ඩු දැනට කප්පාදු වැඩපිලිවෙලවල් ක්‍රියාත්මක කරන ආකාරයේ "ඒ හා සමාන හදිසියකින්ම", එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතය ද ඒවා සිදු කල යුතු බව වෝල්කර් අවධාරනය කලේය.

© www.wsws.org